# කෘෂිකර්මය ආශ්‍රිත පාරම්පරික දැනුම

ශ්‍රී ලංකාව කෘෂිකාර්මික රටකි. මෙය අපට හොඳින් අසා හුරුපුරුදු පාඨයකි. මෙය දිනකට වරක් හෝ නොඇසෙන දිනයක් වෙතොත් ඒ කලාතුරකිනි. ඒ තරමටම එය ඇසෙන අපගේ ලේ, මස්, ඇට, නහර දක්වා දිවෙන ගතට සුවයක් ගෙන දෙන වදනකි. අපේ රට කෘෂිකාර්මික රටක් බවත් එහි වෙසෙන අප ගොවියන් බවත් කෙනෙක් ප්‍රකාශ කරන්නේ නම් ඔහු හෝ ඇය එම ප්‍රකාශය කරන්නේ ඉමහත් ආඩම්බරයෙනි. ගෞරවයකිනි. ඒ තරමටම එය අපගේ ජන ශක්තිය දක්වාම දිවෙන ශ්‍රේෂ්ඨ වූ කියමනක් බවට පත්ව ඇත්තේය. පරපුරෙන් පරපුරට ඒ වටා ගෙතුනු ඥානය පාරම්පරික කෘෂිකාර්මික ඥානය ලෙස අපි අද ව්‍යවහාර කරන්නෙමු. පාරම්පරික කෘෂිකාර්මික දැනුම යනු එම ඥානයේ අග්‍ර ඵලයයි.

## පාරම්පරික ගොවියාට ජලය ප්‍රශ්නයක් නොවේ.

ශ්‍රී ලංකාව ඝර්ම කලාපයේ පිහිටි රටකි. සමකය ආසන්නයේ පිහිටා තිබීම තවත් වාසනාවකි. ඒ තුළින් කෘෂිකර්මාන්තයට හිතකර වූ පාරිසරික හා දේශගුණික විභවයක් අපට දායාද කර ඇත්තේය. දවසකට පැය දොළහක කාලයක් අඛණ්ඩව සූර්ය ශක්තිය ලබන මහ පොළොවත්, ගහකොළ හා සතා සිවුපාවුන් වෙසෙන මනරම් වූ දේශයක් අපට උරුම කර ඇත්තේය. එහි ප්‍රණාමය පරිසරයට මෙන්ම එය මෙතුවක් කල් සිය පාරම්පරික වූ ඥානයේ අනුහසින් පරපුරෙන් පරපුරට සුරකිමින් රැගෙන ආ සැමට හිමිවිය යුත්තේය. කර්කටක නිවර්තනය සූර්යයාගේ ශක්තිය උපරිමයෙන් ලබන කාලය තුළ ශ්‍රී ලංකාවට නිරිත දිග මෝසමේ වැසිඵල ලැබෙයි. මකර නිවර්තනය එම ශක්තිය උපරිමයෙන් ලබන කාලය තුල ඊසාන දිග මෝසම් වැසි ලබයි. සමකය සූර්යයාගේ ශක්තියේ උපරිමයෙන් ලබන කාලය තුළ අන්තර් මෝසම් වැසි ඵල ලබයි. මේ නිසා ශ්‍රී ලංකාවේ ගොවියාට ජලය කිසිදාක ප්‍රශ්නයක් වූයේ නැත. ප්‍රශ්නයක් වන්නේද නැත. නමුත් අද බොහෝ විට එය ප්‍රශ්නයක් කරගෙන ඇති සැටියක් පාරම්පරික වූ දේශීය ඥානය තුලින් දකින කවරකුට උවද වැටහේ. මහපොළොවට පොහොර පිටතින් එකතු කළ යුතු නොවන්නේ එම ශක්තිය සූර්යා මුල්කොට ලබා දෙන බව පාරම්පරික ඥානය තුළින් අපගේ ගොවියන් හොඳින් දැන සිටි නිසාය. ගහකට වැලකට පොත්තක් ඇති බවත් එහි ජලය ඇති බවත් පමණක් නොව ගහක වැලක මුල් කොටසේ ජලය වැඩිපුර ගබඩා වෙන බවත් අතුඅග කොටසේ අඩුවෙන් ජලය රැස්වෙන බවත් ඔවුන් දැන සිටියේ තමන්ටම ආවේනික වූ ඥානය තුලිනි. එය වටහාගත් පැරැන්නා පළතුරු ගෙඩියක් නෙලා ගන්නේ ගහක වැලක අග කොටසිනි. මුල් කොටසේ ගෙඩි හා කරල් බීජ ලබා ගන්නට වෙන් කළේ එහි ඇති සරුබව නිසාය. ගහක පොළොව යටට යන කෙඳි මුල්වලින් උරා ගන්නා ජලයේ යූරියා සාරය ගහට උරා ගන්නා බව පමණක් නොව පිටතින් යූරියා එකතු නොකිරීමටද පැරණි ගොවියා වගබලා ගත්තේය. ස්වභාවික කැලයේ සරුපසේ ඇති හයුමස් තට්ටුව මත පවතින යූරියා ප්‍රමාණය ගස් වැල් උරා ගන්නා බව ඔවුන් දැන උගත්තේ ඉබේ වැවෙන ස්වභාවික වනාන්තරවලිනි. ඒවායේ සරුවට වැවෙන රුස්ස ගස්වැල් වලින් එය තේරුම් ගත් පාරම්පරික ගොවියා කිසිදිනකත් තම කුඹුරට, හේනට, වත්තට පිටතින් පොහොර ගෙනවිත් දමන්නට සිතුවේ නැත. ජලය සුරැකෙන පසක් තනන්නට වෙහෙසුන ඔහු අවම බිම් සැකසුමෙන් ජලය රැක ගන්නට වෙරදැරූ පාරම්පරික ගොවියා පොහොරත්, පසත් ජලයත් අතර පවතින්නා වූ සහසම්බන්ධතාවය වටහාගත්තේ සිය දේශීය වූ ඥානය තුළිනි.

## සෝදා පාලුව පාරම්පරික ගොවියාට සුවිශේෂ ගැටලුවක් නොවේ.

ස්වභාවික වනාන්තරයේ පස සුරැකෙන අයුරු වටහාගත් ඉපැරණි ගොවියාට සෝදාපාලුව අරුමයක් නොවිය. නමුත් අද ගොවිබිමක මූලික කාර්ය මෙන්ම වියදම් අධික කාර්යව ඇත්තේද පස සංරක්ෂණයයි. අපටම ආවේණික වූ සංස්කෘතියකින් පෝෂණය ලද්දා වූ දේශීය කෘෂිකර්මය හා දේශීය වූ දැනුම අභිබවා යමින් හුදු ලාභයම පදනම් කරගත්

කෘෂිකර්මයකට වේගයෙන් ඇදී ගිය අපි එයින්ම පීඩාවට පත්ව ගිමන් හරිමින් අම්බලමක නතර වී ඇත්තේය. පයක් තබන්නට පොළොවක් නොමැති කතරක හුදකලාව මියැදෙමින් සිටින්නෙමු. ගොවිතැනට ජලය මෙන්ම පසද පස මෙන්ම පොහොරද අවශ්‍යය. මේ සියල්ල ස්වභාව ධර්මයේ දායාදයෝය. සුරැකීම කාගේත් වගකීමය. විසඳුම ඇත්තේ පාරම්පරික වූ දේශීය ඥානය තුළය. පරිසර හිතකාමී ගොවියා කිසිවිටකත් වෙසෙසින් පොහොර හදන්නට හෝ පිටතින් ගෙනවිත් දමන්නට හෝ වෙහෙසෙන්නේ නැත. තම වත්තේ, හේනේ, කුඹුරේ කොම්පොස්ට් හැදෙන හැටි බලා සිටිනවා මිස හා එයට සුදුසු පරිසරය සකසා දෙනවා මිස කොම්පෝස්ට් සකස් කිරීමට නිතරම වෙහෙසෙන්නේ නැත. පාරිසරික ඥානය තුළින් දෙවන පරම්පරාවකට ඉගැන්නුවේ කොම්පෝස්ට් හැදීමට නොව හැදෙන හැටි ඉගෙන ගැනීමටය. ඒ නිසාම සෝදාපාලුවට සංරක්ෂණ ක්‍රම වෙසෙසින් ඉගෙනගෙන භාවිතා කරන්නට හුරුවීමක් අවශ්‍ය නොවීය. උරුම වූ ඥානය තුළ එය අන්තර්ගත විය. දෙවන පරපුරක් ඒවා වැළඳ ගත්තේද ආදරයෙන් හා සෙනෙහසිනි. නමුත් සංවර්ධනයේ මහිමය ඒ සියල්ල වෙනස් කිරීමට වෙර දරනු ඇත. තම ප්‍රාණ ශක්තිය තුළ දේශීය වූ ඥානය රැක ගත්තවුන් ඥානධාරීන් වශයෙන් හෙට දිනක අභිෂේක ලබනු ඇත. ඒ ඔවුන් කළ කැපකිරීම නිසාවෙනි.

## මහ කන්නය තුල අල, ලූනු වගා නොකරයි.

යල මහ කන්නයට නොව කලට වේලාවට කරන ගොවිතැන හසුරුවා ගන්නට හැකි ඥානයක් පාරම්පරික ගොවියා සතුවිය. සූර්යා පොළොවට ලංවී පවතින කාලය යල් කන්නය ලෙස සාමාන්‍ය භාවිතය වේ. කලට වේලාවට කරන ගොවිතැන් හසුරුවා ගන්නනට හැකි ඥානයක් පාරම්පරික ගොවියා සතු විය. එම ලංවීම අංශක 17 1/2$^{0}$ කි. එය අංශක 30 දක්වා වෙනස්වීමේ කාලය මහ කන්නය වේ. පොළොවේ ආනතිය අංශක 23 1/2$^{0}$ ලෙස හෝ ශ්‍රී ලංකාවේ පිහිටීම සමකයට අංක 6 1/2$^{0}$ ක් ඉහළින් වම් හෝ නොදැන සිටියත් ඉපැරණි ගොවියා ඉන් ඔබ්බට ගිය ඥානයකින් පරිපූර්ණව සිටි බව ඔවුන්ගේ ක්‍රියාකාරකම්වලින්ම පැහැදිලි වේ. මහකන්නයේ දෙසැම්බර් මාසය තුළ අධික වර්ෂාව ලැබෙන බව දැන සිටියා පමණක් නොව අල ලූනු වගාවෙන් එම කාලය තුළ ඈත් වී සිටීමටද ඔවුන් දැන සිටියේය. අල බැසීමට සෙන්ටිග්‍රේඩ් අංශක 10 ක උෂ්ණත්වය අවශ්‍ය බව ඔවුන් දැන සිටියේ සිය දේශීය ඥානය තුළිනි.

## ජනවාරි 10 - 15 අතර පිදෙන ගොයම් එල බරයි

දුරුතු මහේ මැද භාගයේ සිට (ජනවාරි 14 වැනිදා සිට) ඇතිවන සීතල රෑ දහවල් සමව පවතින බව දැන සිටි පාරම්පරික ගොවියා එය සෙන්ටිග්‍රේඩ් අංශක 10 ක උෂ්ණත්වයක් බව නොදැන සිටියත් එම කාලය එලබර අස්වැන්නක් ගෙනදෙන පීදෙන ගොයමට හිතකර බව දැන සිටියේ අත්දැකීමෙන් ලබාගත් ඥානය තුළිනි. ඒ අනුව සිය වගා කාලය හසුරුවා ගත්තා මිස යලට මහට නියමිත වූ වගා රටාවක් ඔවුන් අනුගමනය කර ඇත.බිම පෙරලුවේ, සී සෑවේ සහ වැපුරුවේ අක්වැසි මැදය.

අන්තර් මෝසම් අක්වැසි සමග සී සෑම හා බිම පෙරලුවා මිස මහ කන්නයේ මහ වැසි මැද කිසිවක් පාරම්පරික ගොවියා සිදු කලේ නැත. මහ වැසි මැද බිම පෙරලීමෙන් සිදුවන සෝදාපාලුව අක්වැසි මැද බිම පෙරලූ පාරම්පරික ගොවියාට ප්‍රශ්නයක් හෝ ගැටලුවක් නොවීය. අන්තර් මෝසම ඔහුට වාසනාව ගෙනදෙන්නක් විය. මහවැසි මැද මහකන්නය ආරම්භ කරන විට සිය කෙත්බිම් වපුරා අවසන් කල පාරම්පරික ගොවියා නිවසට වී විවේකයෙන් කාලය ගතකලේය. අක්වැසි කාලය තුළ වුවද ජල හිඟය නිසා ඔහු පසුබාන්නේ නැත. පාරම්පරික වූ සිය ඥානය තුළ එයට ගැලපෙන වගාක්‍රම විය. වැසි මද වුවද අවම බිම සැකසුමකින් හා අඩු ජල මට්ටමකින් වැඩි කුඹුරු ප්‍රමාණයක් වැපිරීමට කැකුලම යොදාගත්තේ පාරම්පරික ගොවියා තුල වූ අසීමිත කෘෂිකාර්මික ඥානයෙනි. අක්වැසි සමයේ කැකුලමට වගා කළ ඔහුට පොහොර යෙදීමට හෝ වල් මර්ධනයට හෝ පිටතින් කිසිවක් ගෙන එන්නට අවශ්‍ය වුයේ නැත. කැකුලමට යෙදු

පිදුරු ටිකම පොහොරක් වල් නාශකයක් විය. ඒ නිසාම ගොවිතැන ලාභදායක ආදායම් මාර්ගයක් විය.

## ගැඹුරට පස පෙරලීමට යන්ත්‍ර සූත්‍ර අවශ්‍ය වූයේ නැත

ඝර්ම කලාපයේ පිහිටි ශ්‍රී ලංකාවේ ගස්වැල් මුල් ඇදීමට එතරම් වෙහෙසෙන්නේ නැත. අතු පතර විහිදෙන දිසාවට මතුපිට පොළොවේ තරමක ගැඹුරින් මුල මංඩලය විහිදීම ඝර්ම කලාපීය තුරුලතාවල විශේෂත්වයක් බව නොදන සිටියත් අත්දැකීමෙන් ලද ඥානයෙන් ඒ බව අවබෝධ කරගෙන ඇත. ගැමි නගුල, සිංහල, උදැල්ල ඒ බවට සාක්ෂි දරයි.

ගැමි නගුල භාවිත කළ ඉපැරණි ගොවියා කිසිවිටකත් පොළොව අගල් 4 කට හෝ 6 කට වඩා ගැඹුරට පෙරලුවේ නැත. එවැනි සීමාවකින් පහළට ඝන පස් තට්ටුවක් ඇති බවත් එය පසේ සරු බව හා දියවර සුරකින ස්වභාව ධර්මයේ දායාදයක් බවත් ඔහු දන සිටියේය. එය ඔහුගේ අත්දැකීමෙන් ලද්දා වූ දැනුමේ මහිමය විය. සුවිශේෂී වූ හැඩයකින් හෙබියා වූ සිංහල උදැල්ල ගොවිබිමට යොදා ගත්තේ එකී අරමුණු ඇතිවය. දවසක් තුළ පැය 24 ක් සූර්යා මේ මහපොළොව රිසි සේ රත් කරන බව ඉපැරණි ගොවියා දන සිටියේය. ඒ තරමින්ම මහපොළොවේ ක්ෂුද්‍රජීවීන්ගේ පැවැත්මද වේගයෙන් සිදුවන බව ඔහුගේ පාරම්පරික වූ ඥානය තුළින් දන සිටියේය. ඒ නිසා ඔහු නිතරම වෙහෙසුනේ පොළොව මතුපිට වෙසෙන වායු ක්ෂුද්‍ර ජීවීන් මෙන්ම පොළොව යට වෙසෙන නිර්වායු ක්ෂුද්‍ර ජීවීන් සියල්ලම රැක ගන්නටය. එයින් ප්‍රයෝජන ගත් ඉපැරණි ගොවියා ගොවිබිමට අවැසි පොහොර ටික දින 35 ක් 45 ක් තරම් කෙටි කාලයක් තුළ සකසා ගන්නට සමත් විය. ඒ නිසාම එකී ක්ෂුද්‍රජීවීන් ඔහුට හිතමිතුරන් විය.

## බහුභෝග වගාව පාරම්පරික ගොවියාගේ ක්‍රම උපක්‍රමයක් විය.

සිය වගා රටාව තුළ ස්වභාවික වනය ගුරුකොට ගත් පාරම්පරික ගොවියා එම ආදර්ශයම තම කුඹුරට හේනට යොදා ගත්තේ වගා උපක්‍රමයක් ලෙසය. පසේ සරු බව රැක ගන්නට, ජලය රැක ගන්නට පමණක් නොව කෘමි හා පලිබෝධ පාලනයට මෙන්ම වල් මර්දනයට එයින් ඔහු ලබා ගත්තේ අපරිමිත වූ මෙහෙයකි. ඒ සඳහා ඔහුට කිසිදු මුදලක් වැය වූයේ නැත. එය බහුභෝග වගාව නමින් වගා ක්‍රමයක් ලෙස පරපුරෙන් පරපුරට ගෙන ආවේය. ගොවිබිමේ කිසිදු ශාකයක් පැළැටියක්, වැළක් අලයක් අතර පොහොර ටික බෙදා ගන්නට තරගයක් නොවීය. ගහෙන් ගහට වැලෙන් වැලට අලෙන් අලයට පොහොර අවශ්‍යතාවය එක හා සමාන නොවීය. වගාබිමට විවිධ වර්ණ රටා මැවෙන විට විවිධ කෘමීන් පියාඹා ආවේ නිරායාසයෙනි. ඒ අතර අහිතකර කෘමීන් සිටියේ නම් ඒ ස්වල්ප දෙනෙකි. හිතකර විලෝපිකයන් ගණනින් විශාල විය. කෘෂි හා පලිබෝධ පාලනයට වෙනත් අහිතකර ක්‍රම උපායන් ඉපැරණි ගොවියාට උවමනා නොවීය. දේශගුණය හා කාලගුණය කොයි ආකාරයෙන් බලපෑවද සිදුවන පාඩුව පියවා ගන්නට බහුභෝග වගාව තුල ඔහුට මගක් තිබුණි. එකම වගා බිමක අවැසි සියලු දේ නෙලා ගන්නට හැකි විය. ආදායම යහපත් වූයේ එකක පාඩුව අනෙකෙන් පියවා ගන්නට බහුභෝග වගාව මගක් වූ නිසාය. පාරම්පරික ගොවියා ස්වයංපෝෂිතව කෘෂිකර්මය කලේ මේ නිසාය. පාරම්පරික ගොවියාගේ ඥානය කෘෂිකර්මයේ ස්වයංපෝෂිත බවේ සැබෑ අරුත විය.

## වල් පැළෑටි පාරම්පරික ගොවියාගේ මිතුරකු මිස හතුරකු නොවේ.

කුඹුරේ හේනේ වැවෙන වල් පැළෑටි ඔවුනට ස්වභාව ධර්මයේ ස්වභාවික සම්පතක් විය. ඒ කිසිවක් ගිනි තබා වැනසුවේ නැත. අද මෙන් එදා කිසිවිටකත් වල් නාශක යොදා වල් මැරුවේ නැත. වල්පැල යුරියා බව ඔවුන් හොඳහැටි දන සිටි නිසා ඒවා වනසා දමන්නට ඔවුන් වෙහෙසුනේ නැත. වගා බිම තුල වල්පැල කෘමීන්ට ආහාර ගබඩා විය. නියර මත, වේලි මත, අස්සනන්තමත, වනාත තුල, එම ගබඩා විය. එයින් තම ආහාර කොටස ලබාගත් කෘමීන් කිසිවිටකත්

බෝගයට හානියක් නොකළේය. කැකුලමට සිදුකළ ඒ ගොවිතැනෙන් සිය ඥානය ලොවට පෙන්නූ පාරම්පරික ගොවියා වල්පැල මිතුරකු මිස හතුරකු නොවන බව කියාපෑවේය.

## සියල්ලට හැඩයක් ඇත. බීජයකටද එය පොදු වූ නියාම ධර්මයකි.

මෙම නියාම ධර්මය හඳුනාගත් පාරම්පරික ගොවියා එය බීජ පැළ කිරීමට යොදා ගත්තේ අත්දැකීමෙන් ලද ඥානය ගොවි බිමට එක් කරමින්ය. බදින පොල්ගෙඩිය කිහිප විටක් සිය අත්ල මත උඩ දමන්නේ ක්‍රීඩාවකට නොව එහි ඇති හරය සිය ඥානය තුළ තැන්පත්ව ඇති නිසාවෙනි. ගසින් බිමට ඇද වැටෙන බීජයට නිසි අතට බරව පොළොවෙ පතිත වීමට සොබා දහමින් ලබාදුන් ජවය පාරම්පරික ගොවියා සිය ඥානය තුළින් සිය ගොවිබිමට යොදා ගන්නට අමතක කලේ නැත. අත්ලේ වියත ගොබිමියට මැණුම් උපකරණය විය. යටිපතුල අඩ එකක් විය. බිත්තර වී මල්ල කුරිණිය විය. කුරුණියෙන් එකක් වපුරන ප්‍රමාණය වී කුරුණියක් විය. එලෙසින් හැඩයෙන් වැඩක් ගත් ඔහු වැපුරුවේද සිටවූයේද හැඩයකටය. හැඩය නොමැති විට පැලය තිගැස්සෙන බවත් තිගැස්සුන පැලය පැළ නොවන බවත් අත්දැකීමෙන් ලද ඥානය තුලින් පසක් කරගෙන සිටියේය.

## සූර්ය ශක්තිය ක්ෂුද්‍රජීවි ක්‍රියාකාරිත්වය වැඩි කරයි.

කෙනෙක් මළ පසු තැන්පත් කළේ හඳුනාගත් දිශානුගතවය. හිස බටහිරටත් පා නැගෙනහිරටත් සිටින සේ එය සිදු කළේ සූර්ය ශක්තිය හා කෂුද්‍රජීවි ක්‍රියාකාරිත්වය අතර පවතින්නා වූ අන්තර් සහසම්බන්ධතාවය සිය ඥානය තුළින් හඳුනාගෙන සිටි නිසාය. එය තම ගොවිබිමටද යොදා ගත්තේ සූර්ය ශක්තිය හා ක්ෂුද්‍ර ජීවී නිසි ක්‍රියාකාරීත්වයක් ඇති කරමින් ස්වභාවික පොහොර සකසා ගැනීමේදීය. නැගෙනහිර සිට බටහිරට ගමන් කරන වාතය උෂ්ණත්වයෙන් වැඩි බවත් උතුර සිට දකුණටත් හෝ ප්‍රතිවිරුද්ධ දිශාවට හෝ හමන සුළඟ සමග ගමන් කරන්නේ සිහිල් වාතය බවත් දන සිටියේ අත්දැකීමෙන් ලද ඥානය තුළින්ය. ඒ තුළින් ගොවිබිම අලංකාරව සකසා ගත්තා පමණක් නොව ස්වභාවික ආපදාවන්ගෙන් රැක ගන්නට ද පාරම්පරික ගොවියාට හැකි වී ඇත්තේය.

## මහකන්නයේ දෙසැම්බර් සහ ජනවාරි මාසවල මහපොළොව තිත්තවෙයි. ඇඹුල් වෙයි.

ගෙඩි වර්ග තිත්ත වෙයි. ඇඹුල් වෙයි. කොළ වර්ග එසේය. නමුත් මහපොළොව තිත්ත වේ නම් ඇඹුල් වේ නම් එය පාරම්පරික ගොවියාට අරුමයක් නොවීය. අත්දැකීමෙන් ලද ඥානය තුළින් ඔහු ඒ බව පසක් කරගෙන සිටියේය. මෙම කාලය අධික වර්ෂාවක් ලබමින් ක්‍රමයෙන් වැසි හමාරවන කාලයකි. මහපොළොව උල්දිය දමන කාලය දෙසැම්බර් සහ ජනවාරි මාසය වේ. භූගත ජලය ද පොළොව මතුපිටට ගලා එයි. ඒ නිසා පොළොවේ ලුනු ගතිය වැඩි වන බව අත්දැකීමෙන්ම දන සිටි පාරම්පරික ගොවියා මෙම කාලය තුළ බීජ වැපිරීම හෝ පැල සිටුවීම සිදු නොකළේය. වගා කළොත් යූරියා පසට බාහිරින් හෝ එකතු කළ යුතු බව හොඳින් දන සිටියේය. පැළෑටි කහ පැහැ ගැන් වී නිසරු වන බව දන සිටියේය. එලෙස සිය ඥානය ගොවිබිමට යොදා ගත් ඔහුට කෘෂිකර්මය නම් කිසිවිටකත් බරක් නොවීය"

## කාලය, කාලගුණය හා දේශගුණය ගොවිතැනට අනාවැකි කියයි.

ගසක් සිටවෙයි. එය පැලවෙයි. හැදෙයි. වැඩෙයි. මලින් පිරෙයි. එල දරයි. මිය ඇදෙයි. මෙම නියාම ධර්මය සිය ඥානය තුළින් හඳුනාගත් පාරම්පරික ගොවියාට කෘෂිකර්මය හෝ ගොවිතැන කිසිවිටකත් බරක් වූයේ නැත. කාල චක්‍රය අනුව කාලගුණය හා දේශගුණය හඳුනාගත් ඔහු එයට අවනතව වගා කටයුතු සකසා ගත්තේ ඉතාමත් නිහතමානීවය. ආගමින්







දහමින් ලද ආහාසය එයට ඉමහත් රුකුලක් ගෙන දුනි දුරුතු මහේ බීජ වැපුරුවේ නැත. පැල සිටවුයේ නැත. මහපොළොව තිත්ත වූ බව දන සිටියේය. එලෙඹෙන නවම් මහේ නියගය පෙනි පෙනී බීජු වපුරන්නට පැළ සිටුවන්නට ඔහුගේ ඥානය ඔහුට ඉඩ දුන්නේ නැත. පවතින ගහකොළ හැලෙන්නට පටන් ගනී. මැදින් මහේ තවදුරටත් වැසි අඩුවන බව දන සිටියේ අත්දැකීමෙන් ලද ඥානය තුලින. එය ගහකොළ දලුලන මාසය බව දන සිටියේය. සූර්යා මුදුන්වන මාසය වන බවද දන සිටියේය. මැදින් මහේ අගට වැස්ස ලැබෙන බව දන සිටියේය. එයට ඔවුන් අක්වැස්ස යැයි කීවේය. ගොවිතැනට කාලය එළැඹ ඇති බව ගොවියාට කීවේ මෙම අක්වැස්සය. මැදින් මහේ දලුළන මිදෙල්ල ගස දකින ගොවියා යල්මහේ ගොවිතැනට සුදුසු කාලය එළඹ ඇති බව තීරණය කරයි. නවම් මහේ මහපොළවට ඇද වැටුනු කොළ පත්‍ර සියල්ල දිරාපත්ව පොහොර බවට පත්වන කාලය එලඹේ. පස කොම්පෝස්ට් සකසා ගැනීම ආරම්භ කරන්නේ අයාසයෙන් තොරවම බව දන සිටින පාරම්පරික ගොවියා පොහොර හදන්නට වෙර දරන්නේ නැත. එයට අවශ්‍ය පරිසරය සකසා දෙමින් ඒ දෙස ඔහු සතුටින් බලා සිටියි. සියල්ල අවසාන නවම් මහේ අග යලේ ගොවිතැන ආරම්භ කරයි. කෙතේ බීජු වැපිරෙද්දී හේනේ නවදලු දකිද්දී නිකමට කියවුනු කවි පාරම්පරික ඥානයෙන් පහලවුනු ජනකවියක් විය. ගහකොලද මහ වනයද නවම් මහේ බිමට හල බීජු දලුලා වැඩෙද්දී බක්මහේ මහ වැසි සමග ලැබෙන අකුණු ගෙන එන්නේ බියකරු මාරයා නොව මහ පොළාවට සූර්යා බව සිය ඥානයෙන් පසක් කර ගන්නට පාරම්පරික ගොවියාට අපහසු වූයේ නැත. හැදුනු වැඩුනු ගහකොල එළඹෙන වෙසක් මහේ මල් එල දරයි. සියලු ගහකොල සිය වර්ගයා බෝ කිරීමේ කටයුත්ත හරිහැටි කරන්නට වෙරදරයි. බක්මහේ අධික වැසි අවසන යලිත් පොළොවේ ලවනතාවය වැඩි බව හඳුනන ගොවියා බීජු වැපිරීම පැල සිටුවීම නතර කර දමයි. හැදු වැඩූ ගහේ වැලේ එල ලබන කාලය පොසොන් මහ එළඹෙත්ම ලගාවෙයි. ඇහැල මහේ සිය වර්ගයා බෝ කිරීමේ කටයුත්ත අරඹන ගහකොළ දකින පාරම්පරික ගොවියා නිකිණි මහේ අක්වැසි සමග යලිත් සිය වගා චක්‍රය ආරම්භ කරන්නේ ආගමිකවුත් ආවේණික වූත් සිරිත් විරිත් පෙරදැරි කරගෙනය. මේ සියල්ල හා බැදුණු ඥානය තුලින් ස්වයංපෝෂිත කෘෂිකර්මයකට පිය නගන්නට පාරම්පරික ගොවියාට හැකියාව ලැබුණි.

## ඉරහඳ ගහකොල සතා සිවුපාවා ගොවිතැනට අනාවැකි කියයි.

පාරම්පරික ගොවියාට සියලු ගහකොළ මිතුරන්ය. සතා සිවුපාවා හිතවතුන්ය. ඉරහඳ ආශිර්වාදයක් විය. එය හැදිනගත් පාරම්පරික ගොවියා ගොවිතැනේදී ඔවුන්ට දක්වූයේ අපරිමිත සෙනෙහසකි. අසීමිත වූ ගෞරවයකි. කිසිවෙකුට හෝ කිසිවකට අගතියක් කරන්නට කිසි විටෙකත් පෙළඹුනේ නැත. ඒ නිසාම ඔවුන්ගෙන්ද තම ගොවිතැනට අගතියක් වුවානම් ඒ ඉතා මද වශයෙනි. එය කිසිවිටකත් අනාවැකි කියන සන්නිවේදකයින් බවට පත් විය. ඒ අතර සතුන් ගහකොළ, ඉරහඳ තාරකා මුල් විය. වෙසෙසින පතොක් කුලයට අයත් වූ දලුක් ගහ ඉඩෝරයට හා වැස්සට අනාවැකි කියන ශාකයක් විය. ඉඩෝරයට ලියලන බව දකින ගොවියා තවදුරටත් ඉඩෝරය පවතිනබව හඳුනාගනී. ගොවිතැන් කටයුතු ඒ අනුව සැලසුම් කර ගනී. ඉඩෝරය අවසානයේ දලුලැම නවතින විට වැසිඑල ළග බව හඳුනාගන්නේ තමන්ටම ආවේණික වූ ඥාන ශක්තියෙනි. දලුක් ගහේ මෙම ක්‍රියාවලියට ප්‍රතිවිරුද්ධ ක්‍රියාවලියක් නියගලා වැල දක්වනු ලබයි. එය ස්වභාව ධර්මයේ නියමයකි. ඈත අහසේ ඇති හද සහ තරු රටා විපරමින් වැස්ස පිළිබඳ අනාවැකි කියන්නට පාරම්පරික ගොවියාට සිය ඥානය තුලින් හැකියාව තිබුණි. ජල වාෂ්ප වැඩි වී පවතින අහසේ හද සහ තරු රටා සම්පව දකින දින වැස්සක් අත ලග බව දකින්නේ සිය ඥානය තුළිනි. භූගත ජලය පොළොවේ මතුපිටට පැමිණි බව හඳුනා ගත්තේ වේයාගේ හුඹස් දලු බැදීමෙනි. කක්කුටුගුලේ ගොඩ දමන පස් ප්‍රමාණය කොතෙක්ද එහි අඩු වැඩිකම අනුව වැස්සට ඇති කාලය මනින්නට ඔහුට හැකියාව තිබුණි. එහි පස් ප්‍රමාණය අඩුද එය වැස්ස ආසන්න බවට ඉගියක් බව සිය ඥානය තුලින් හඳුනාගත් ඉපැරණි ගොවියා ඒ අනුව සිය වගා කටයුතු සැලසුම් කලේය. හලන්පෙන්දාගේ කඩිවර හැසිරීම ඇට්කුකුළාගේ කලබල හැසිරීම වැස්ස ආසන්න බව කියන අනාවැකියක් බව දන සිටියේ අත්දැකිමෙන් ලද ඥානය තුළිනි.

## කෘෂිකර්මයේ ස්වයංපෝෂිත බවට දේශීය ඥානය

කෘෂිකර්මය භෞතික වු දෙයකි. එය පරිසරය හා බැඳී පවතී. ගොවිබිමේදී මතුවන ගැටලුද භෞතික ඒවා වේ. වන සතුන්, කෘමින් හා පලිබෝධකයින් සහ පොහොර ප්‍රධාන වේ. මේවා ගැටලු වුවද සිය පාරම්පරික ඥානය විනිවිද දකින ඉපැරණි ගොවියාට ගැටලු නොවීය. සිය ආධ්‍යාත්මික බලය මෙහෙය වූ ඔහු දිනට, නැකතට, වේලාවට හා කරණයට වැට බැන්දේ වන සතුන්ගෙන් සිය වගාබිම් රැක ගන්නටය. නියමිත ඉන්න, නියමිත මාවරය හා නියමිත වැල්පොට එහිදී සුවිශේෂී කලමනා විය. දිවිකදුරු, ඉන්න, නික ඉන්න කැප්පෙට්ටියා මාවරය, දෙමට මාවරය, නාමිරිත්තා වැල, පෝටා වැල, මස්බැද්දවැල ආදිය ඒ අතර සුවිශේෂ වූ කළමණා විය. ගොවිබිමට ආරක්ෂිත වැට එයම විය. කාබනික පොහොර පිටතින් ගෙනවිත් දමනවාට වඩා වගාබිම් තුළම කොම්පෝස්ට් හැදෙන්නය සැලැස්සුවේ භෞතික ගැටලුවක් වුවද විසඳුම අන්තරික බලයක් තුළ පවතින බව හැදිනගත් ඥානයක් ඔහු සතු වූ හෙයිනි. ස්වභාවික වූ කෘමි හා පළිබෝධ පාලන ක්‍රම තුලින් එම හානිය වලක්වා ගන්නේ එම ඥානය ගොවිතැනට යොදා ගන්නා තැනේදීය. වගාවට වින කරන නවදෙනෙකු පමණ වූ කෘමීන් වනසන්න භෞතික වූ ක්‍රමවේදයන්ට පසෙකලා ආධ්‍යාත්මය හා බැදුනු ක්‍රමවේදයන් භාවිතා කරන්නේ හිතකර වූ විසිහතක් පමණ වූ විලෝපිකයන් ආරක්ෂා කර ගන්නටය. එය ඉපැරණි ගොවියා සතු වූ පාරම්පරික ඥානයකි. ආධ්‍යාත්මික ශක්තිය හා බැදුණු යන්ත්‍ර මන්ත්‍ර හා කෙම් වනසතුන් පලවා හැරීමට යොදා ගත්තේ ඒ හා බැදුනු සිය ආධ්‍යාත්මික හා පාරම්පරික ඥානය තුළිනි. දේශීය ඥානය ස්වයංපෝෂිත කෘෂිකර්මයේ පදනම විය.

## දේශීය ඥානය කෘෂිකර්මයේ ප්‍රධාන ගැටලුවට විසඳුමකි.

මානව ශිෂ්ටාචාරයේ ආරම්භය කොතනද ඒ දක්වා ඇත ඉතිහාසයකට කෘෂිකර්මය බැඳී ඇත්තේය. ශ්‍රී ලංකාව ඝර්ම කලාපයේ පිහිටීම නිසා කෘෂිකර්මයටම ආවේණිකව මා තුළ දේශීය චින්තනයකට මග පාදා ඇත. ඒ හා බැදුනු ඥානය අපටම ආවේණික වූවකි. එය එදිනෙදා භාවිතා වන්නකි. ඒ නිසාම ජනප්‍රිය වෙයි. එහෙයින් ප්‍රාදේශීක වශයෙන් එක්තරා ජන කොටසකට සීමාව පවතී. කල්පිත සංකල්ප හා සිද්ධාන්ත මත ගොඩ නැගෙයි. ඒ නිසාම එහි ස්වභාවය ගතික වෙයි. ඒ වටා සිදු කෙරෙන අභ්‍යන්තර නව සොයා ගැනීම් නිසා හෝ බාහිර දැනුම සමග ගැටීමෙන හෝ එක්කෝ විනාශ විය හැක. නැතිනම් වැඩිදියුණු විය හැක. කට වහරින් බැදි පරපුරෙන් පරපුරට සන්නිවේදනය වෙයි. ඒ අනුව දේශීය ඥානය නව තාක්ෂණය හා මුසු වීමෙන් දේශීය නව තාක්ෂණයක් ගොඩ නගා ගන්නට විශාල අවකාශයක් ඇත්තේය. එය ඥාන තාක්ෂණය මත මිස ජාන තාක්ෂණය මත සිදු නොවිය යුතුය. ඒ සඳහා නව පර්යේෂණයක් සිදු කළ යුතුව ඇත. එම පර්යේෂණයන් විද්‍යාත්මක පදනමකින් සිදු කිරීමෙන් කෘෂි කර්මයේ ප්‍රධාන ගැටලුවලට විසඳුම් සෙවීම ගැටලුවක් නොවනු ඇත. ඒ සඳහා කෘෂිකර්මය හා බැදුණු දේශීය ඥානය සුරැකිව තවත් පරපුරකට ගෙන යාම අප සියල්ලන්ගේම වගකීම හා යුතුකම වන්නේය. ස්වයංපෝෂිත දේශීය කෘෂිකර්මයක් කරා යන ගමනට දේශීය ඥානය පදනම වන්නේය.


දි.මු. කරුණාතිලක
ක්ෂේත්‍ර උපදේශක
ජෛව විවිධත්ව පර්යේෂණ තොරතුරු හා පුහුණු මධ්‍යස්ථානය (BRIT)
බදුල්ල.



මූලාශ්‍ර: 1. සිද්ධි අධ්‍යයනය හා තොරතුරු සටහන් කර ගැනීම
2. පර්යේෂණ අත්දැකීම් - පාරිසරික ගොවි කණ්ඩායම, සිරිමල්ගොඩ, බදුල්ල
3. භාවිතයන් හා කටවහරින් පැවත එන තොරතුරු විමර්ශනය කිරීම
4. පෞද්ගලික අත්දැකීම් හා දින සටහන්